**ශීර්ෂය 206 සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූනි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 19 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය  මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී.  මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) මෙම වාර්තාවේ 1.6.1(අ) ඡේදයේ සඳහන් නිරීක්ෂණ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශ පිළිබඳ මාගේ වාර්තාව මගින් කර තිබූ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1. ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමෙහි හර ශේෂය සහ අත්තිකාරම් පාලන ගිණුම හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව හර ශේෂය අතර රු.444,761ක වෙනසක් පැවතුණු අතර 2004 වර්ෂයට පෙර සිට පැවත එන මෙම වෙනස හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට එම වෙනස සොයා ගැනීමට කටයුතු කරමින් පවතී. | අත්තිකාරම් පාලන ගිණුම හා භාණ්ඩාගාර පරිගණක වාර්තා අනුව ශේෂයේ වෙනස හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කල යුතුය. |

**(ආ) මූලධන වියදම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.5,210,000 කට තක්සේරු කරන ලද වාහන 2ක වටිනාකම රු.6,640,000ක් ලෙස රු.1,340,000ක් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි. | 2021 වර්ෂයේ මෙම වාහන නැවත තක්සේරු කළ අතර, එම නව තක්සේරු වටිනාකම අනුව 2022 වර්ෂයේ ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන්හි වැඩියෙන් දැක්වෙන බැවින් මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |

1.6.2 **විගණන සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.12,928,192 ක අගයකින් යුතු ජ'නල් සටහන් 16 කට අදාල ජ'නල් වවුචර් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ඉදිරියේදී නිවැරදි වැය විෂයයන්ටම වියදම හර කිරීමට උපදෙස් ලබා දෙන ලදි. | ජ'නල් වවුචර් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

### 1.6.3 පොදු සම්මත ගිණුම්කරණ මූලධර්මවලට අනුකූල නොවීම

සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පොදු සම්මත ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රකාශන තොග ගබඩාවෙහි 2021 දෙසැම්බර් 31 දිනට පැවති, 2021 වර්ෂයේ මිලදීගත් රු.5,447,174ක් වූ පොත් 15256ක්ද ඇතුලු ප්‍රකාශන 83336ක තොගයේ වටිනාකම ගිණුම්වල දැක්වීමට කටයුතු කර නොතිබූ අතර මේ සම්බන්ධයෙන් වූ ගිණුම් ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි. | අදාල තොග සමීක්ෂණ වාර්තාව ලබා දී ඇත. | අවසන් ප්‍රකාශන තොග වටිනාකම ගිණුම්වල දැක්වීමට හා අදාල ගිණුම් ප්‍රතිපත්තිය හෙළිදරව් කිරීමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය සාහිත්‍ය සම්මාන උළෙල සඳහා 206-2-2-3-1409 වැය විෂයය යටතේ රු.6,000,000 ක් වෙන්කර තිබියදී 206-2-3-6-1409 (ජාතික කලා උළෙල) වැය විෂයය යටතේද රු.16,480,000 ක් වෙන් කර තිබූ අතර සම්මාන උළෙල සඳහා රු.9,767,150 ක් වැය කර තිබුණි. | 2020 සහ 2021 වර්ෂයන්ට අදාල සාහිත්‍ය උත්සව 2021.12.03 දින පවත්වන ලදි. ඇස්තමේන්තුගත මුදල නොලැබීම හේතුවෙන් රාජ්‍ය සාහිත්‍ය සම්මාන උළෙල සිදු කිරීමට ජාතික කලා උළෙල වැය විෂයය යටතේ මුදල් ලබා ගැනීමට සිදු විය. | නිශ්චිත කාර්යය සඳහා ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන වෙන්කිරීම මනා කලමනාකරණයකින් යුතුව සිදු කළ යුතුය. |
| (ආ) | වැය විෂයයන් 04 කින් දැරිය යුතු ප්‍රතිපාදන ඉක්මවූ රු.5,497,119 ක වියදම් මුදල් රෙගුලාසි 66 යටතේ මුදල් මාරුකර ගැනීමට කටයුතු නොකර, වෙනත් වැය විෂයයන් 06 ක් මගින් වැයකර තිබුණි. | අදාල වැය විෂයයන්ට ප්‍රමාණවත් ප්‍රතිපාදන අය වැය තුළින් ඉල්ලුම් කර වෙන් කර ගැනීමට කටයුතු කරන ලෙසට උපදෙස් ලබා දෙන ලදි. | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන විට මුදල් රෙගුලාසි 66 යටතේ මුදල් මාරුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**2.2** බැරකම් හා බැදීම්වලට එළඹීම

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය අනුව වැය විෂයයන් 02 කට අදාලව රු.454,995 ක ශේෂයන් දක්වා තිබුණද එකී බැරකම්වලට අමතරව 2022 ජනවාරි හා පෙබරවාරි මාසයන්හි 2021 වර්ෂයට අදාලව වැය විෂයයන් 17 ක් යටතේ රු.6,081,279 ක් ගෙවා තිබුණි. මේ අනුව මූල්‍ය ප්‍රකාශන වල බැදීම් හා බැරකම් රු.6,081,279 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2021.12.31 දිනට අදාල වැය විෂයයන් ප්‍රතිපාදන සීමාව තුළ පමණක් වියදම් දරා ඇත. | වර්ෂයට අදාල සියලු බැරකම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තුව විසින් ටවර්හෝල් රඟහල පදනම වෙත ගෙවිය යුතු 2016 හා 2017 වර්ෂයන්ට අදාල රු.1,053,000ක ශේෂ එම පදනමේ මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ශේෂ ලෙස දක්වා තිබුණද දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශනවල බැරකම් ලෙස දක්වා නොතිබුණි. | ටවර් හෝල් පදනම වෙත ගෙවිය යුතු සියළු බිල්පත් නිරවුල් කර ඇත. | ටවර්හෝල් රඟහල පදනමේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ලැබිය යුතු ශේෂ දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට හා නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | |
| | (i) 4.2, 4.5, 4.6 හා 6.3 උපවගන්ති | වර්ෂ 05 ඉක්මවූ මියගිය නිලධාරින් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු.23,931 ක්වූ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ණය ශේෂයන් වසර 20 කට පෙර සිට පැවත එන අතර ණයගොනු ලේඛනාගාරයේ ද නොමැත. ඔවුන් පිළිබඳ විස්තර වෙනත් ලේඛන ආශ්‍රයෙන් හෝ සොයා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| | (ii)4.5 උප වගන්තිය හා 2015 ඔක්තෝබර් 09 දිනැති අංක PFD/RED/2015/08පොදු(i) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3(ඉ) ඡේදය | වසර 05 ක කාලය ඉක්මවා ඇති වැඩ තහනම් කල නිලධාරින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.36,380 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එක් නිලධාරියකුගෙන් ණය අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. අනෙක් නිලධාරියාගේ ණය ගොනුව සොයා ගත නොහැක. | ආයතන සංග්‍රහයේ හා අදාල චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (iii) 4.5, 4.6 උපවගන්ති හා 2019 ජුනි 27 දිනැති අංක | වසර 05 ක කාලය ඉක්මවා ඇති සේවය හැරගිය නිලධාරින් 12 දෙනෙකුගෙන් අයවිය යුතු රු.101,673 ක්වූ | තොරතුරු සොයා ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කර ණය ශේෂ පියවා ගැනීමට කටයුතු කරන ලෙස විෂය භාර | ආයතන සංග්‍රහයේ විධිවිධාන හා අදාල |

| | | | | |
|---|---|---|---|---|
| | 5/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3(ඉ) හා 4 ඡේදය | ණය ශේෂ හා නිලධාරින් 6 දෙනෙකුගෙන් අයවිය යුතු හඳුනා නොගත් රු.23,923 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිලධාරී දැනුවත් කර ඇත. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 66(2), (3), (4) හා (5)** | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමෙන් තොරව ජ'නල් සටහන් මගින් වැය විෂයන්/ වැඩසටහන් අතර රු.12,298,192 ක් මාරු කර තිබුණි. | වැරදි වැය විෂයයන්ට හර වූ වියදම්, නිවැරදි වැය විෂයයන්ට මාරුකිරීමට මෙම ජ'නල් සටහන් යොදා ඇත. ඉදිරියේදී අවශ්‍ය අනුමැතිය ලබාගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.7 ඡේදය | රජයේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වලට ස්ථාන මාරු වී ගිය සේවකයින් 23 දෙනෙකුට අදාල රු.90,568 ක් වූ වසර 05 ඉක්ම වූ ණයශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂයන් වසර 20 කට පෙර සිට පැවත එන අතර, ඔවුන් ස්ථාන මාරු වී ගිය ස්ථාන සොයා ගැනීම සඳහා අදාල ගොනු හෝ ලේඛන සොයාගත නොහැකි වී ඇත. | අදාල චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2017 ජුනි 19 දිනැති අංක 04/2017 දරන දෙපාර්තමේන්තු චක්‍රලේඛය | | | |
| | (i) 03 වගන්තිය | 1. චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව හා ත්‍රිපුද්ගල කමිටුවේ නිර්දේශ ලබා නොගෙන මසකට රු.200,000 බැගින් එක් කලාකාරිනියකට 2020 හා 2021 වර්ෂයන්හිදී පිළිවෙලින් රු.1,200,000ක් හා රු.2,400,000ක් වශයෙන් එකතුව රු.3,600,000ක් ගෙවා තිබුණි. | 2018 ජුනි මස 27 දිනැති අංක.අමප/18/1228/801/008 අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලැබී ඇති අතර, ජනාධිපති ලේකම් විසින් ලබා දී ඇති නියෝගය පරිදි, 2019 නොවැම්බර් මස සිට මෙම දීමනාව අගහිඟ කලාකරු වැය විෂයය යටතේ ගෙවීමට කටයුතු කර ඇත. | අදාල චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| 2. | ත්‍රිපුද්ගල කමිටු අනුමැතියකින් තොරව කලාකරුවන් 16 දෙනෙකු වෙත රු.1,190,000 ක කලාකරු විශේෂ ආධාර ලබා දී තිබුණි. | විශේෂ ආධාර කමිටු නිර්දේශ මත ආධාර ගෙවීමට අනුමැතිය ලබා දී ඇති අතර චක්‍රලේඛ සංශෝධනය කඩිනමින් සිදු කර ගැනීමට කටයුතු කෙරෙමින් පවතී. | අදාල චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) 2(ii) වගන්තිය | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව මාධ්‍යවේදියෙකුගේ අභාවය වෙනුවෙන් රු.503,500 ක මුදලක් වැය කර තිබුණි. | මාධ්‍යවේදියාගේ අවසන් කටයුතු රාජ්‍ය අනුග්‍රහය යටතේ සිදු කළ යුතු බවට අග්‍රාමාත්‍යතුමන් විසින් නියෝග කර ඇති බව දන්වා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් 2021.02.22 දිනැතිව නිකුත් කර ඇති නියෝගය පරිදි විශේෂ අවස්ථාවක් සේ සලකා මෙම ගෙවීම සිදු කර ඇත. | අදාල චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තු ක්‍රියාකාරි සැලැස්මෙහි ඇතුලත් වූ කලාකරුවන් සඳහා හැඳුනුම්පතක් නිකුත් කිරීම වෙනුවෙන් රු.100,000ක ප්‍රතිපාදන ලබාදී තිබූ අතර කලාකරුවන් සඳහා ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පතක් නිකුත් කිරීම සඳහා ජාතික උරුම, ප්‍රාසාංගික කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය සඳහාද රු.2,000,000ක ප්‍රතිපාදන ලබාදී එම කාර්යයන් ආයතන 02 විසින්ම ඉටු කර ඒ සඳහා වියදම් දරා තිබුණි. | කලාකරුවන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලැස්මෙහි කාලයක් තිස්සේ ඇතුළත්ව වැය විෂයයන් හරහා ප්‍රතිපාදන ද වෙන් කර ඇති කාර්යයකි. මෑතකදී ආරම්භ කරන ලද ජාතික උරුම, ප්‍රාසාංගික කලා හා ග්‍රාමීය කලා ශිල්ප ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මගින්ද මෙම කාර්යය ඉටු කිරීම සම්බන්ධයෙන් පිළිතුරු ලබා දිය නොහැක. | දෙපාර්තමේන්තු /අමාත්‍යාංශ සිය අරමුණු හා කාර්යයන් පැහැදිලිව නිර්වචනය කරගෙන ඒ මත කටයුතු කලයුතු අතර ප්‍රතිපාදන ලබාගැනීමේදී ද්විත්ත්වකරණය වැළැක්වීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ජාතික සාහිත්‍ය උත්සවය, පෙරහැර ආධාර හා පොසොන් හේව්සි පූජාව සහ අගහිඟ කලාකරුවන්ට ආධාර යන කාර්යයන් වෙනුවෙන් පිලිවෙලින් රු.4,000,000ක්, රු.4,000,000ක් හා රු.32,000,000ක් ප්‍රතිපාදන දෙපාර්තමේන්තුවට ලබාදී තිබූ අතර ඒ හා සමාන කාර්යයන් වූ ජාතික සාහිත්‍ය කලා උළෙල, පෙරහැර හා වෙනත් සංස්කෘතිකාංග සඳහා දායකත්වය සහ ශිල්පීන්ට ජීවනාධාර සැපයීම වෙනුවෙන් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සඳහාද පිලිවෙලින් රු.20,000,000ක්, රු.10,000,000ක් හා රු.5,000,000ක් ප්‍රතිපාදන ලබාදී එම කාර්යයන් ආයතන 02 විසින්ම ඉටු කර ඒ සඳහා වියදම් දරා තිබුණි. | ජාතික සාහිත්‍ය උත්සවය, පෙරහැර ආධාර හා පොසොන් හේව්සි පූජාව, හා අගහිඟ කලාකරු ආධාර යන වැඩසටහන් දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලැස්මෙහි කාලයක් තිස්සේ ඇතුළත්ව අදාල වැය විෂයයන් හරහා ප්‍රතිපාදන ද වෙන් කර ඇති කාර්යයන් වේ. | දෙපාර්තමේන්තු /අමාත්‍යාංශ සිය අරමුණු හා කාර්යයන් පැහැදිලිව නිර්වචනය කරගෙන ඒ මත කටයුතු කලයුතු අතර ප්‍රතිපාදන ලබාගැනීමේදී ද්විත්ත්වකරණය වැලැක්වීමට පියවර ගත යුතුය. |

## 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 අයවැය ඇස්තමේන්තුව මගින් එකතුව රු.8,800,000 ක් වෙන්කර තිබූ වර්ෂය තුල ක්‍රියත්මක කල යුතු වූ දිස්ත්‍රික් සාහිත්‍ය උත්සව, සූසැට කලා මංගල්‍ය, මහා වංශය පිළිබඳ හඳුන්වාදීම හා දැනුවත් කිරීම, දොලොස්මහේ පහන හා සුභාවිත ගී වියමන යන ක්‍රියාකාරකම් ඉටුකර නොතිබුණි. | පොත් ප්‍රදර්ශනයට සමගාමීව පවත්වනු ලබන සූසැට කලා මංගල්‍යය, සුභාවිත ගී වියමන සහ මහා වංශය එළි දැක්වීම පැවති කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ නොපවත්වන ලදි. දොලොස්මහේ පහන වැඩසටහන සඳහා දිස්ත්‍රික් කාර්යාල වෙත අදාල ප්‍රතිපාදන මුදා හැර ඇතත් වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීමට ප්‍රායෝගික ගැටළු මතුවිය. | වර්ෂයක් තුල සිදු කල හැකි කාර්යයන්/ ක්‍රියාකාරකම් පිළිබඳව නිසි අධ්‍යනයකින් හා ඇගයීමකින් පසුව කාර්යයන් සැලසුම් කලයුතු අතර සැලසුම් කල කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මෙන්, මහාවංසය සම්බන්ධ දැනුවත් කිරීමේ හා හඳුන්වාදීමේ වැඩසටහන, වලිසිංහ හරිස්චන්ද්‍ර කේන්ද්‍රයේ තාප්පය ඉදිකිරීම සහ මිහින්තලයේ උතුරු දකුණු මිතුරු සෙවනෙහි වායුසමන යන්ත්‍ර සවිකිරීම හා බිම් සැකසුම් වෙනුවෙන් පිලිවෙලින් රු.2,200,000ක්, රු.800,000ක් සහ රු.300,000ක් ප්‍රතිපාදන වෙන් කර තිබුණද වර්ෂය තුළ අදාල කාර්ය සිදු නොකර ඊට පරිභාහිර වූ කාර්යයන් සඳහා පිලිවෙලින් රු.1,285,867 ක්, රු.669,405 ක් සහ රු.97,189 ක් වැයකර තිබුණි. | එම ප්‍රතිපාදන වලින් නිදහස් මන්දිරයේ නවීකරණ කාර්යයන්, නාට්‍ය පුහුණු පාසලේ තීන්තාලේපණය හා සිංහල ශබ්දකෝෂ කාර්යාලයේ ප්‍රතිසංස්කරණ කටයුතු ආදිය සිදු කර ඇත. | වර්ෂයක් තුල සිදු කල යුතු කාර්යයන්/ ක්‍රියාකාරකම් පිළිබඳව නිසි අධ්‍යනයකින් හා ඇගයීමකින් පසුව එම කාර්යයන් සැලසුම් කලයුතු අතර සැලසුම් කල කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ක්‍රියාකාරි සැලැස්මෙන් ප්‍රතිපාදන වෙන් නොකරන ලද අන්තර් කලායතන රාජ්‍ය සම්මාන උළෙල වෙනුවෙන් රු.6,498,350ක්, කලාකරු සුවදම් වැඩසටහන වෙනුවෙන් රු.658,000ක් සහ කලාභූෂණ සම්මානලාභීන්ට ත්‍යාග ලෙස අයෙකුට රු.25,000 බැගින් 170 දෙනෙකු සඳහා රු.4,250,000ක් ගෙවා තිබුණි.. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙන් මෙම වැඩසටහන් සඳහා වැය වන මුදල නිවැරදිව සඳහන් කර ඇති අතර වැඩසටහන් වෙන් වෙන් වශයෙන් දක්වා නොතිබූ අතර, ඉදිරියේ දී එය නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | වර්ෂයක් තුල සිදු කල යුතු කාර්යයන්/ ක්‍රියාකාරකම් පිළිබඳව නිසි අධ්‍යනයකින් හා ඇගයීමකින් පසුව කාර්යයන් සැලසුම් කලයුතු අතර සැලසුම් කල කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ක්‍රියාකාරි සැලැස්ම මගින් නිකුත් කිරීමට ඉලක්ක කල විශ්වකෝෂ කාණ්ඩ ප්‍රමාණය 20 ක් වූ අතර 2014 වර්ෂය දක්වා කාණ්ඩ 14 ක් පමණක් නිකුත් කර තිබුණි. මීට අදාළව වර්ෂය තුළ රු.5,000,000 ක් වෙන්කර තිබූ අතර වසර 07 ක කාලයක් ගතව තිබුණද ඊළඟ කාණ්ඩය එලි දක්වා නොතිබුණි. | විශ්ව කෝෂයක් සම්පාදනයේ දී දීර්ග හා සංකීර්ණ ක්‍රියාවලියක් අනුගමනය කල යුතු අතර අවුරුදු හතරක පමණ කාලයක් ගත වේ. දැනට වසර ගණනාවක සිට කර්තෘ මණ්ඩලයේ සිටිනුයේ එක් කර්තෘවරයකු වන අතර, සිංහල විශ්ව කෝෂයේ 14 වන කාණ්ඩය පළ වූයේ එබඳු පරිසරයකය. | විශ්වකෝෂ කාණ්ඩ නිකුත් කිරීම සඳහා සැලසුම් හා ඉලක්ක ස්ථාපිත කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.5 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 1956 සැප්තැම්බර් මස 26 දිනැති අංක 10975 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් මෙම දෙපාර්තමේන්තුව පිහිටුවා ඇති බව කාර්යසාධන වාර්තාවේ දක්වා තිබුණද එම අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් දෙපාර්තමේන්තුව පිහිටුවා නොමැති බව නිරීක්ෂණය වූ අතර දෙපාර්තමේන්තුව පිහිටුවීමට අදාල ලේඛන හා දෙපාර්තමේන්තු කාර්යභාරය පැවරුණු ලේඛන ද විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අදාල ලේඛන ඉදිරියේ දී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | කාර්යසාධන වාර්තාවේ තොරතුරු නිවැරදිව දැක්වීමට සහ දෙපාර්තමේන්තුව පිහිටුවීමට හා කාර්යභාරය පැවරීමට අදාල ලේඛන විගණනය වෙත ලබා දීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මූල්‍ය නොවන වත්කම් ලෙස රු.1,325,765,846 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද කාර්යසාධන වාර්තාවේ මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය යටතේ අදාල වත්කම්වල අගය ලෙස රු.982,660,597ක් එනම් රු.343,105,249ක් අඩුවෙන් වාර්තා කර තිබුණි. | මෙම වරද හඳුනාගත් අතර අවසන් ප්‍රගති වාර්තාවේ නිවැරදි කිරීමට කටයුතු කරන ලදි. | කාර්යසාධන වාර්තාවේ තොරතුරු නිවැරදිව දැක්වීමට කටයුතු කළ යුතුය. |

## 3.6 ප්‍රසම්පාදනයන්

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------------------ | ------------ |
| (අ) | නිදහස් මන්දිර පරිශ්‍රයෙහි සිදුකල අලුත්වැඩියාවන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.5.1(ඇ) ට පටහැනිව සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවට රු.1,044,144කට පවරා තිබූ අතර මාර්ගෝපදේශ 8.9.1 ප්‍රකාරව කොන්ත්‍රාත්කරු සමඟ ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණි. අලුත්වැඩියාව 2021 ජනවාරි 27 දින වන විට නිමකල යුතු වුවත් 2022 පෙබරවාරි වන විටත් නිමකර නොතිබුණි. 2020 වර්ෂයේ රු.2,022,562ක් වූ නිදහස් මන්දිරයේ අලුත්වැඩියා කටයුතු එම දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණද 2021 වර්ෂය අවසාන වනතෙක් එකී කාර්යද නිමකර නොතිබුණි. | 2021 වසරේ පවරන ලද අලුත්වැඩියා කටයුතු 2021.01.27 දිනට නිම කරන ලෙස රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව වෙත දැනුම් දුන් අතර නිදහස් උත්සවයට අදාල අලුත්වැඩියා කටයුතු කඩිනමින් අවසන් කරන ලදි. ඉතිරි අලුත්වැඩියාවන් නිම කරන ලෙස 2021.10.26 දිනැති අංක. DCA/04/03/12/2021-93 දරණ ලිපිය මගින් සිහි කැඳවීම් කර ඇතත් පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ නිසි කාල සීමාව තුළ අදාල අලුත්වැඩියාවන් නිම කිරීමට නොහැකි විය. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර කොන්ත්‍රාත් පැවරීමේදී පූර්ව කොන්ත්‍රාත් නිම කිරීම පිළිබඳ සැලකිලිමත් විය යුතුය. |

(ආ) **ජෝන් ද සිල්වා සමරු රඟහල නවීකරණය කිරීම - පලමු අදියර**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | |
|---|---|---|
| (i) 2011 සැප්තැම්බර් 15 දිනැති අංක අමප/11/1673/547/021 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව 2013 නොවැම්බර් මස රඟහල කඩා ඉවත් කර තිබුණු අතර ඒ සඳහා රු.3,641,618 ක පිරිවැයක් දරා තිබුණි. එසේ වුවද 2014 පෙබරවාරි 20 දින රඟහල නවීකරණය සඳහා අංක:CA/03/2014 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කර තිබුණි. | අදාල සංදේශය මගින් නවීකරණය කොට සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා දුන්නද ඒ වන විට ජෝන් ද සිල්වා සමරු රඟහල පිළිසකර කිරීමකින් හෝ අලුත්වැඩියා කිරීමකින් යථා තත්ත්වයට පත් කර ගැනීමට නොහැකි තත්ත්වයක පැවතිණි. මේ නිසා කළ යුතු කාර්යයන් පිළිබඳ ජෝන් ද සිල්වා සමරු රඟහල නවීකරණය සඳහා පත් කරන ලද මොරටුව විශ්ව විද්‍යාලයීය උපදේශක සභාව විසින් එය ප්‍රතිසංස්කරණයට වැය වන විශාල මුදලද සලකා නවතාවයෙන් ඉදිකිරීමට කටයුතු කරන ලදි. | අමාත්‍ය මණ්ඩල තීරණයන්ට අනුකූලව කටයුතු කළ නොහැකි වන්නේ නම් ඒ බව අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) රඟහලේ නවීකරණ කටයුතු සඳහා වූ කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.2.1ට පටහැනිව සීමිත තරඟකාරී ලංසු කැඳවීමකින් රු.386,587,337 කට පවරා තිබූ අතර කොන්ත්‍රාත්කරු සමඟ වූ ගිවිසුම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.9.3ට පටහැනිව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක විසින් අත්සන් තබා තිබුණි. | ජෝන් ද සිල්වා සමරු රඟහල හා ජාතික කලාභවන පරිශ්‍රයන් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ආයතන බැවින් සංස්කෘතික අධ්‍යක්ෂ විසින් ගිවිසුම් අත්සන් කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ලංසු කැඳවීමට හා ගිවිසුම්ගත වීමට කටයුතු කළ යුතුය. |
| (iii) කොන්ත්‍රාත්කරු විසින් වසර 03 ක කාල ප්‍රමාදයක් සහිතව ඉදිකිරීම් කටයුතු සිදු කර තිබූ අතර ප්‍රමාද ගාස්තු ලෙස අයකරන ලද රු.38,658,734ක මුදල නිසි අනුමැතියකින් හා සාධාරණ කරුණු තහවුරු කර ගැනීමකින් තොරව නැවත කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. | II අදියරෙහි ඉදිකිරීම් කාර්යයන් ආරම්භ කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් නොවීම හේතුවෙන් රජයට මූල්‍යමය පාඩුවක් සිදු වී නොමැති බව නිරීක්ෂණය වූ බැවින් අය කර ගන්නා ලද ප්‍රමාද ගාස්තු නැවත කොන්ත්‍රාත්කරු වෙත නිදහස් කර ඇත. | කොන්ත්‍රාත්කරු වෙත නැවත ගෙවූ ප්‍රමාද ගාස්තු ආපසු අය කර ගැනීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (iv) ගොඩනැඟිල්ල නිමකර නිසිපරිදි භාර දී නොතිබියදී රු.38,658,734 ක් වූ අවසාන ගෙවීමද කර තිබූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5.4.6(ආ) ට පටහැනිව කාර්ය නිමකල බවට සහතිකයක් නොමැතිව රු.19,329,367 ක රඳවා ගැනීම් මුදලින් සියයට 50ක් එනම් රු.9,664,683ක් ද කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | උපදේශන සේවා ආයතනයේ නිර්දේශ මත ගෙවා ඇත. | ඉදිකිරීම නිමකර නිසි පරිදි භාර දීමෙන් පසු අවසාන ගෙවීම සිදු කිරීමට කටයුතු කල යුතු අතර රඳවා ගැනීම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ගෙවිය යුතුය. |
| (v) කාර්ය නිම කිරීමට ගතවූ වසර 03 ක කාල ප්‍රමාදය හේතුවෙන් බිල්පත් වල පැවති මිල විචලතා සඳහා රු.9,257,523 ක් ගෙවා තිබූ අතර එය දෙපාර්තමේන්තුවට සිදු වූ පාඩුවක් විය. | කොන්ත්‍රාත් ගිවිසුම අනුව මිළ විචල්‍යතා සඳහා ගෙවීම් සිදු කළ යුතු බැවින් උපදේශන සේවා ආයතනයේ නිර්දේශ මත ගෙවීම් කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රසම්පාදන කාල සටහනක් අනුව කටයුතු කළ යුතුය. |
| (vi) උපදේශන ආයතනය සමග වූ ගිවිසුම අනුව ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුගේ රඳවා ගැනීම් මුදල් නිදහස් කිරීමට අදාල සහතික නිකුත් කිරීමෙන් පසු ගෙවිය යුතු අවසාන උපදේශන සේවා ගෙවීම රු.888,318ක් වූ අතර එම මුදලෙන් රු.444,159 ක් වගකීම් කාලය අවසාන වීමට පෙර ගෙවා තිබුණි. | සමස්ථ ඇස්තමේන්තුව සඳහා උපදේශන ආයතන විසින් නිර්දේශ ලබා දී ඇති අතර, ඒ අනුව ඉදිරි කටයුතු සිදු කර ඇත. | කාර්ය නිමකර අදාල සහතික නිකුත් කිරීමෙන් පසු අවසාන උපදේශන සේවා ගෙවීම කල යුතුය. |
| (vii) රඟහල කඩා දමා වසර 08 ක් ගත වී තිබුණද නැවත ඉදිකර මේ දක්වා භාවිතයට ගත නොහැකිව තිබුණි. | රඟහලේ දෙවන අදියර සඳහා ගිවිසුම්ගතවී ඇති අතර මේ වන විට ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතී. | ඉදිකිරීම නිමකර රඟහල භාවිතයට ගැනීමට කටයුතු කටයුතු කළ යුතුය. |
| (ඇ) ජාතික කලාභවන වැඩි දියුණු කර සංරක්ෂණය කිරීම | | |
| පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) ජාතික කලාභවන නවීකරණය සඳහා නාවික හමුදාව වෙත 2020 දෙසැම්බර් 31 දින ගෙවා තිබූ රු.5,500,000 ක මුදල උපයෝජනය කල බව සනාථ කිරීමට අවශ්‍ය ලේඛන විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | පිළිතුරු ලබා දී නොමැත. | රු.5,500,000 ක වියදම සනාථ කිරීමට අවශ්‍ය ලේඛන විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ii) 2 වන අදියර ඉදිකිරීම් සඳහා නාවික හමුදාව ඉදිරිපත් කරන ලද වියදම් ඇස්තමේන්තුව රු.85,792,644ක් වුවත් එම ඇස්තමේන්තුව ඉක්මවා උපදේශන ආයතනය විසින් රු.88,086,213 කට කොන්ත්‍රාත්තුව නිර්දේශ කර තිබුණි. | නාවික හමුදාව විසින් ලබා දී තිබූ ඇස්තමේන්තුව පරීක්ෂා කර බලා එය රු.88,086,213 ක් ලෙස නිවැරදි කර උපදේශන සේවා ආයතනය විසින් නිර්දේශ කර ඇත. | වැඩි මිලකට නිර්දේශ කිරීමෙන් සිදුව ඇති අලාභය කොන්ත්‍රාත්තුව නිර්දේශ කළ උපදේශන ආයතනයෙන් ආවරණය කරගත යුතුය. |
| (iii) කොන්ත්‍රාත්තුව පැවරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5.4.8 ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි. | නාවික හමුදාව සිදුකරන ඉදිකිරීම් කාර්යන් සඳහා කාර්යසාධන සුරක්ෂණ ඉදිරිපත් නොකරන බවට නාවික හමුදාපති වෙතින් 2021 අප්‍රේල් 23 දින ලබාගත් ලිපියක් ඉදිරිපත් කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iv) දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත අවස්ථා 04 කදී රු.69,001,798 ක ප්‍රතිපාදන වෙන් කර දී තිබුණද සිදු කරන ලද කාර්යයන් කවරේද යන්න සනාථ කර ගැනීමට අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. සිදු කල කාර්යයන් පිළිබඳ උපදේශන සේවා ආයතනය විසින් නිසි අධීක්ෂණයක් හා ඇගයීමක් සිදු කර තහවුරු කරවා ගැනීමෙන් පසු ප්‍රතිපාදන නිදහස් කල යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | නාවික හමුදාව වෙත ප්‍රතිපාදන නිදහස් කිරීම් සිදු කර ඇත්තේ උපදේශන සේවා ආයතනයේ නිර්දේශ මත වේ. | ප්‍රතිපාදන නිදහස් කිරීමට ප්‍රථමයෙන් සිදු කල කාර්යයන් පිළිබඳ උපදේශන ආයතනයේ නිර්දේශ ලබා ගැනීමට කටයුතු කල යුතුය. |
| (v) නාවික හමුදාව විසින් රු.11,783,886 කට ඇස්තමේන්තු කර තිබූ ගොඩනැගිල්ලේ පොළව, බිත්ති හා සිවිලිම නිමකිරීම බාහිර පෞද්ගලික පාර්ශවයක් වෙතින් ඉටු කරවා ගෙන තිබුණද ඒ සඳහා ප්‍රසම්පාදන අධිකාරියේ අනුමැතිය ලබා නොතිබුණි. ඒ සඳහා අදාල ඇස්තමේන්තුව රු.7,868,802 කින් ඉක්මවා රු.19,652,668ක් එම ආයතනය වෙත ගෙවා තිබුණි. | නාවික හමුදාව විසින් ප්‍රසම්පාදන කාර්යයන් සිදු කර එම කාර්යයන් නිම කිරිම සඳහා බාහිර පාර්ශවයන් වෙත ලබා දී ඇත. සිවිලිම සකස් කිරීමේදී ප්‍රායෝගිකව මතු වූ ගැටළු මත එහි පිරිවැය ඇස්තමේන්තුගත මුදලට වඩා වැඩි වී ඇත. | උප කොන්ත්‍රාත් සඳහා සහ ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සීමා ඉක්මවා වියදම් දැරීම සඳහා ප්‍රසම්පාදන අධිකාරියේ අනුමැතිය ලබාගත යුතුය. |

| | | |
|---|---|---|
| (vi) 2 වන අදියරට අදාලව සිදු කර තිබූ අමතර වැඩ සඳහා රු.4,703,308ක පිරිවැයක් දරා තිබුණද මේ සඳහා උපදේශන ආයතනයේ නිර්දේශ ලබා නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | අමතර වැඩ සඳහා උපදේශන සේවා ආයතනයේ නිර්දේශ ලබාගත යුතුය. |

## 3.7 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 8.2 ඡේදය ප්‍රකාරව තවදුරටත් වාර්තා කලයුතු මූල්‍ය නොවන වත්කම් තිබේ නම් ඒවා නිසි පරිදි හදුනාගෙන පිරිවැයට හෝ පිරිවැය හදුනාගෙන නොහැකි නම් තක්සේරු කල අගයට ගිණුම් ගත කල යුතු වුවත් 2018 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව සතු ගොඩනැඟිලි 05ක්, තක්සේරු අගය රු.66,000,000ක් වූ වාහන 20ක් සහ වටිනාකම සඳහන් නොවූ වාහන 03 ක් හා හෙක්ටයාර් 3.5731ක් වූ ඉඩම් 04ක් 2021 දෙසැම්බර් 31 වන විටද ගිණුම්ගත කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව සතු වාහන වලට අදාල තක්සේරු වාර්තා ලද විට ගිණුම්ගත කරනු ඇත. ඉඩම් පවරා ගැනීමේ කටයුතු සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටළු නිරාකරණය කර ගැනීමෙන් පසු එම ඉඩම් සහ ඒවා තුළ පිහිටි මෙම ගොඩනැගිලි තක්සේරු කර ගැනීමටත් ඒ අනුව ගිණුම් ගත කිරීමටත් කටයුතු කරමින් පවතී. | අදාල චක්‍රලේඛයේ 8.2 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අයත් සියලු මූල්‍ය නොවන වත්කම් හදුනාගෙන පිරිවැය හෝ තක්සේරු වටිනාකම මත ගිණුම්ගත කල යුතුය. |

## 3.8 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 සිට 893 දක්වා වූ රෙගුලාසි හා 612 වැනි අධිකාරිය මතවූ රජයේ නිලධාරින්ගේ ඇප ආඥා පනත ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් 52 ක් ඉකුත් වසරේ හදුනාගෙන තිබුණද එම නිලධාරින් වෙතින් ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇප තැබිය යුතු ප්‍රමාණය හා ඇප තැබිය යුතු ආකාරය පිළිබඳව අමාත්‍යාංශ ලේකම් වෙතින් උපදෙස් ලබා ගැනීමට යොමු කර ඇත. උපදෙස් ලැබුණු පසු ඒ අනුව කටයුතු කරනු ලැබේ. | විධිවිධාන ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් වෙතින් ඇප ලබාගැනීමට අප්‍රමාදීව කටයුතු කල යුතුයි. |

**4.** **යහපාලනය**

**4.1** **අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණු අතර 2011 වර්ෂයේ අනුමත කරන ලද අභ්‍යන්තර විගණන තනතුර පිරවීමට 2022 මැයි වන විටත් කටයුතු කර නොතිබුණි. | දැනට බුද්ධශාසන දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී අභ්‍යන්තර විගණක තනතුරේ වැඩ බැලීමට පත් කර ඇත. | ජාතික විගණන පනතේ විධි විධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 28ක් වූ දෙපාර්තමේන්තුවේ ජොෂ්ය මට්ටමේ අනුමත කාර්ය මණ්ඩලයෙන් 12 ක් එනම් සියයට 43 ක පුරප්පාඩු පැවතුණි. වසර ගණනාවක සිට පුරප්පාඩු වී පවතින ගණකාධිකාරි තනතුර ද මේ තුල විය. | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් සිදු කරන තනතුරු පුරප්පාඩු සඳහා අදාළ නිලධාරීන් අනුයුක්ත කර දෙන ලෙස ඉල්ලීම් ලිපි මඟින් ඉදිරිපත් කර ඇත. | ජොෂ්ය මට්ටමේ අත්‍යවශ්‍ය තනතුරු වල පුරප්පාඩු පුරවා ගැනීමට අවශ්‍ය කටයුතු කල යුතුය. |